විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (09)
W.A. විමලසේන සර් - 2021. 12. 12
(8.30 – 11.30)

# විෂයමාලා සංවර්ධන ආකෘති

# දේශනය -I



<u>අරමුණු ආකෘති</u> -

- රේඛීය ආකෘති (ටයිලර් ආකෘතිය)
- චක්‍රීය ආකෘති (විලර් ආකෘතිය)

විෂයමාලා න්‍යාය හෝ සංකල්ප තීරණය කිරීමෙන් පසුව එම විෂයමාලාව සංවර්ධනය කිරීම සඳහා උචිත ආකෘතියක් තෝරාගත යුතුය. මේ සඳහා භාවිතා කළහැකි ආකෘති කිහිපයක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ආකෘති වර්ග කිහිපයකි. මෙහිදී පළමුව විෂයමාලා ආකෘති යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි හඳුනා ගැනීම වැදගත් වේ.

සැබෑ ලෙසම විෂය මාලාව විශේෂඥයින් සකස් කළ විෂයමාලාව තුළ මූලික ප්‍රතිපත්ති, සංකල්ප ඉලක්කගත කර ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රම තෝරා ගැනීම, ඇගයීම සහ ගුරුවරුන් සඳහා විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සැකසීමේ ක්‍රියාවලියක් ලෙස නැතහොත් ක්‍රමවේදයක් ලෙස විෂයමාලා ආකෘති හඳුනාගත හැකිය. ඒ අනුව විෂයමාලා ආකෘති වර්ග 02 කට බෙදා වෙන්කළ හැක. ඒ අනුව,

1. අරමුණු ආකෘති
2. අරමුණු නොවන ආකෘති

ලෙස වර්ග 02 කි.

## අරමුණු ආකෘති

අරමුණු ආකෘතියක් යනුවෙන් අදහස් වන්නේ විෂය මාලාව සැකසීමේදී මූලිකව අරමුණු තීරණය කිරීමෙන් පසු එම අරමුණු අවසානයේදී ඉටුවී ඇත්දැයි සලකා බැලීමයි. එහිදී ඇගයීමෙන් අවසන් වන නිසා අරමුණු ඉටුවී ඇත්දැයි සොයා බැලීමක් අරමුණු ආකෘතිවල දක්නට ලැබේ. ඒ අනුව අරමුණු පදනම් කරගත් විෂයමාලා ආකෘතියක් මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ රැල්ප් ටේලර් නමැති විෂයමාලා විශේෂඥයා විසින් 1949 දීය. විද්‍යාත්මක ප්‍රවේශය අනුගමනය කරමින් අමරිකාවේ පාසල්වල සහතිකලත් ගුරුවරුන් සඳහා විෂය මාලාව ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා ලද ආකෘතිය 1949 වී වැඩිදියුණු කරමින් විෂයමාලා සංවර්ධන ආකෘතියක් ලෙස ටයිලර් ආකෘතිය නමින් විෂයමාලා සංවර්ධන ආකෘතියක් ඉදිරිපත් කරන ලදී.


ඔහු මෙම ආකෘතිය සකස් කිරීමට පෙර විෂය අරමුණු, මූලධර්ම, ප්‍රතිපත්ති මොනවාද යන්න පොතක් මගින් විග්‍රහ කරන ලදී. එය විෂයමාලාවේ මූලික අදහස්, උපදෙස් ලබාදීමේ මාර්ගෝපදේශනයක් ලෙසද හේතුවිය. ඒ අනුව ඔහු විසින් විෂයමාලා සංවර්ධන ආකෘතියක් ඉදිරිපත් කළ අතර එය ප්‍රධාන මූලධර්ම 04 ක් මගින් නිරූපණය විය. ඒවානම්,

1. අරමුණු තීරණය කිරීම
2. අන්තර්ගතය තීරණය කිරීම
3. සංවිධානය කිරීම

**4.** ඇගයීම

**යනාදියයි.**

**එය පහත දැක්වෙන ආකාරයට දැක්විය හැක (මෙය රේඛීය ආකෘතියකි)**




**ඔහු මෙම විෂය මාලා සංවර්ධන ආකෘතිය හඳුන්වා දී ඇත්තේ විෂයමාලාවේ මූලධර්ම හා ඉගැන්වීමේ කරුණු ආශ්‍රය කරගෙනය. ඔහු ඒ සඳහා පොතක්ද ලියා ඇත. ඔහු සඳහන් කරන්නේ අධ්‍යාපනික අරමුණු සකස් කර ගන්නේ කෙසේද ඒවා සංවිධානය කර ගන්නේ කෙසේද ඒවා විශ්ලේෂණය කරන්නේ කෙසේද යන්න සහ සිසුන්ට මෙම අරමුණු සපුරා ගැනීමට හැකිවන පරිදි සකස් කරන්නේ කෙසේද යන්න විස්තර කරයි. ඔහු ඒ සඳහා ප්‍රධාන තරුණු 04 ක් ඉදිරිපත් කරයි. ඒ අනුව,**

I. **අරමුණු හා ඉලක්ක අරමුණු**
II. **අන්තර්ගතය තෝරා ගැනීම**
III. **සංවිධානය කිරීම**
IV. **තක්සේරු කිරීම/ ඇගයීම**

**යනාදියයි. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන්නේ විෂය මාලා ආකෘතියක් ඉදිරිපත් කරන විට පහත සඳහන් ප්‍රශ්න 04 ක් ඉදිරපත් කරයි. ඒ අනුව,**

I. **පාසල සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කළ යුතු අධ්‍යාපනික අරමුණු මොනවාද ? (අරමුණු තීරණය කිරීම)**
II. **මෙම අරමුණු සාක්සාත් කරගැනීම සඳහා අධ්‍යාපනික අත්දැකීම් මොනවාද ? (විෂය ප්‍රමාණය)**
III. **මෙම අධ්‍යාපනික අත්දැකීම් ඵලදායී ලෙස සංවිධානය කළ හැක්කේ කෙසේද ? (සංවිධානය)**
IV. **අරමුණු සාක්සාත් කරගන්නේද යන්න තීරණය කරන්නේකෙසේද ? (ඇගයීම)**

ටයිලර්ට අනුව ඕනෑම විෂය මාලාවක් සංවිධානය කිරීමේදී ඉහත ප්‍රශ්න 04 ට පිළිතුරු සැපයිය යුතු වේ. එපමණක්ද නොව මෙම ආකෘතිය ස්වභාවයෙන්ම රේඛීය වන අතර විෂයමාලා සංවර්ධනයේදී මූලික අංශය වන්නේ අරමුණු බවත් පෙන්වා දෙයි. එපමණක්ද නොව ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීම සහ සංවිධානය කිරීම, අරමුණු පාදක වන අතරම තක්සේරුව හා ඇගයීම මෙම ආකෘතියේ මූලික පදනම වේ.

## ටයිලර්ගේ ආකෘතිය සම්බන්ධ අදහස්

මෙය මූලික වශයෙන් රේඛීය ආකෘතියකි. එමෙන්ම අරමුණු සහගත ආකෘතියකි. මෙම ආකෘතිය තාර්කික වන අතර අනුක්‍රමික හා ක්‍රමානුකූල ක්‍රමවේදයක් ගොඩනගා ඇත. ඔහු මෙහිදී විෂයමාලාව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශ සපයයි.එපමණක්ද නොව ඒවා පරික්ෂා කිරීමට අවස්ථාව ලබා දෙයි. මෙම ආකෘතිය අනුව කාලය ඉතා වැදගත් වේ. මෙහි එන අරමුණු සහ අන්තර්ගතයන් කෙරෙහි විශ්වාසයක් ඇති අතර ආකෘතීන් ඉදිරිපත් කරන අන්තර්ගතය පැහැදිලිව දක්වා ඇත.

ඉගෙනුම හා ඉගැන්වීමමේ ස්වභාවය අනපේක්ෂිත වීම මෙහි ඇති ගැටලුවකි. එනම් තෝරාගත් පරමාර්ථ අරමුණුද අවසානයේදී ඉටුවේදැයිද යන්න ගැටලුවක් මතුවේ. හුදෙක්ම අප පන්ති කාමරයේ අරමුණු ඒ අාකාරයෙන්ම අවසන් ඵලය ලෙස දැකිද හැකිද යන්න ප්‍රශ්නයක් මතුවේ. එය කොතෙක් ප්‍රයෝගිකද යන ප්‍රශ්නයටද තුඩුදේ. එපමණක්ද නොව ඉගෙනීමේ ප්‍රමාණය හෝ අපේක්ෂිත ප්‍රතිඵලය ස්තීරවම සඳහන් කළද නොහැක.


## විලර්ගේ ආකෘතිය

ටයිලර්ගේ ආකෘතියේ ඇති යම් යම් අඩුපාඩු මගහරවා ගැනීම සඳහා K.D විලර් නැමැති අධ්‍යාපනඥයා විසින් 1967 දී නව විෂයමාලා සංවර්ධන ආකෘතියක් ඉදිරිපත් කරන ලදී. ඔහු ඉදිරිපත් කර ඇති ආකෘතිය චක්‍රීය ආකෘතියක් වේ. එනම් වෘත්තාකාර සැලැස්මකට අනුව මෙම ආකෘතිය ඉදිරිපත් කර ඇත.

ඔහු ඉදිරිපත් කළ මෙම ආකෘතිය අනුව ප්‍රධාන සංරචක / නිර්ණායක 05ක් තෝරාගෙන ඇත. එම සංරචක නම්,

1. අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම (පරමාර්ථ, අරමුණු, අභිමතාර්ථ)
2. ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීම
3. අන්තර්ගතය තෝරා ගැනීම (විෂය සන්ධර්භය)
4. ඉගෙනීමේ අත්දැකීම් සහ අන්තර්ගතය සංවිධානය කිරීම හා සමෝධානය කිරීම
5. ඇගයීම

ආදියයි. මෙය පහත දැක්වෙන ආකාරයට දැක්විය හැක. ඒ අනුව,




ඉහතින් දක්වා ඇති විලර්ගේ ආකෘතිය චක්‍රීය ආකාරයෙන් ඉදිරිපත් කර ඇත. එක් අවස්ථාවක් ඊළඟ අවස්ථාවට සම්බන්ධ වේ. කෙසේවෙතත් විලර්ගේ චක්‍රීය ආකාරයෙන් ලැබෙන අත්දැකීම් ඊළඟ අවධිය සඳහා ප්‍රතිපෝෂණ ලබාදිය හැක. සෑම එකක් සමග සම්බන්ධ වීම නිසා අදාළ ප්‍රතිපෝෂණ ඉක්මනින් ලබා ගත හැක. එමෙන්ම ඉදිරිපත් කිරීමේදී කාලයක් ගතවේ. එසේම ක්‍රියාත්මක වීම සම්බන්ධ ප්‍රායෝගික ගැටලුද පැනනැගිය හැක.

ඔහු ඉදිරිපත් කර ඇති වෘත්තාකාර නැතහොත් චක්‍රීය සැලැස්මට අනුව නැවත අරමුණු හා සම්බන්ධ කොට ඇත. එම නිසා විෂයමාලාව ක්‍රියාත්මක වීමේ අඩුපාඩු හඳුනාගත හැක. විෂයමාලාවේ කාලීන ගැටලු, ප්‍රවණතා, නවීකරණයන් සඳහා ඉඩප්‍රස්ථා ලබා දී ඇත. එම තත්වය නිසා විෂයමාලාව කාලානුරූපීව නැවත නැවත ප්‍රතිසංවිධානය කිරීමට හැකියාව ලැබේ. එමෙන්ම මුල්කරගත් අරමුණු හා ඉලක්ක ඉටු නොවීමේදී කීප අවස්ථාවකදීම නැවත සලකා බැලීමට ඉඩකඩ ලබා දී ඇත.

මෙම විලර්ගේ ආකෘතිය අනුව කාලය සම්බන්ධ ගැටලු පවතින අතර ක්‍රියාත්මක වීමේ දුර්වලතාද මතුවිය හැක. එමෙන්ම ඇගයීමේ අවස්ථාව අනෙකුත් සංරචකයන් සමග සම්බන්ධ නොවීමද අඩුපාඩුවක් ලෙස හඳුනාගත හැකිය.

## ටයිලර්ගේ හා විලර්ගේ ආකෘතිය අතර වෙනස්කම් හදුනා ගැනීම

### ටයිලර්ගේ ආකෘතියේ වෙනස හදුනා ගැනීම

- විෂයමාලා සංවර්ධන ක්‍රමය විෂයමාලා සංවර්ධන ආකෘතියකි
- 1949 ඉදිරිපත් කරන ලදී
- මෙය අරමුණු සහගත ආකෘතියකි
- මෙය රේඛීය ආකෘතියකි
- මෙම ආකෘතියේ ප්‍රධාන කොටස් 04 කි. (අරමුණු තීරණය කිරීම, විෂය ප්‍රමාණය, අත්දැකීම්, ඇගයීම)
- මෙම ආකෘතියේ ඇගයීමේ කොටසෙන් අවසන් කර ඇත.
- ඇගයීම, අරමුණු සමග සම්බන්ධ නොවේ.
- එමනිසා ඉදිරි ප්‍රතිපෝෂණ, ඇගයීමේ වෙනස්කම්, විෂයමාලාවේ වෙනස්කම් වලට ඉඩප්‍රස්ථා අඩුය
- අඛන්ඩව ඉදිරියට ගමන් කිරීමක්/ දිශානුගත වීමක් පෙන්නුම් කරයි

### විලර්ගේ ආකෘතියේ වෙනස හදුනා ගැනීම

- මෙය විෂයමාලා සංවර්ධන ආකෘතියකි.
- 1976 දී ඉදිරිපත් කරන ලදී
- මෙයද අරමුණු සහගත ආකෘතියකි
- මෙම ආකෘතිය චක්‍රීය වේ. (රෝද මාදිලිය/වෘත්තාකාර ප්‍රෙවිශය)
- මෙහි තොරතුරු සැලකිල්ලට ගනී
- ප්‍රතිපෝෂණ යන්ත්‍රයක් දක්වා ඇත.ඇගයීම අවසන් නොවේ. එය විෂය මාලාවේ මුලට නැවත සම්බන්ධ කරයි.
- වෘත්තාකාර සැලැස්මක් නිසා ඇගයීම නැවත අරමුණු සමග සම්බන්ධ කරයි
- කාලානුරූපී අත්දැකීම් ලබා ගැනීමට ඉඩකඩ ලබා දී ඇත.
- විෂයමාලාවේ නවීකරණය සදහා ඉඩප්‍රස්ථාව ඇත.
- විෂයමාලාවේ ගැටළු, අඩුපාඩු මගහරවා නැවත සකස් කිරීමටඉඩකඩ ලබා දී ඇත.(ඇගයීම නැවත මුලට සම්බන්ධ කර ඇති හෙයිනි)
- දිගුකාලීන ක්‍රියාවලියක්
- ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ ගැටළු පැනනැගිය හැක